ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2232/37 - 2021 ජුනි මස 18 වැනි සිකුරාදා - 2021.06.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 7 වන සංශෝධනය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාව

පහත I කොටසේ සඳහන් පරිදි සංශෝධිත 2013 දෙසැම්බර් 23 දිනැති අංක 1842/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසේ දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 ජුනි මස 01 වැනි දින.

**I කොටස**

සංශෝධන අංක 1 - 2015 ජුලි 16 දිනැති අංක 1923/47 දරන අති විශෙෂ ගැසට් පත්‍රය
සංශෝධන අංක 2 - 2016 අගෝස්තු 11 දිනැති අංක 1979/33 දරන අති විශෙෂ ගැසට් පත්‍රය
සංශෝධන අංක 3 - 2018 අගෝස්තු 30 දිනැති අංක 2086/22 දරන අති විශෙෂ ගැසට් පත්‍රය
සංශෝධන අංක 4 - 2018 සැප්තැම්බර් 14 දිනැති අංක 2088/58 දරන අති විශෙෂ ගැසට් පත්‍රය
සංශෝධන අංක 5 - 2018 නොවැම්බර් 02 දිනැති අංක 2095/48 දරන අති විශෙෂ ගැසට් පත්‍රය
සංශෝධන අංක 6 - 2019 අගෝස්තු 19 දිනැති අංක 2137/5 දරන අති විශෙෂ ගැසට් පත්‍රය

1A - G 34445 — 25 (2021/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II කොටස**

10.2.3 (ආ)

(iii) සපුරා තිබිය යුතු වෙනත් සුදුසුකම් :

(ආ) සහ (ඇ) ඉවත් කර, පහත කොටස (ආ) ලෙස ඇතුළත් කරනු ලැබේ.

උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10.2.5 සුදුසුකම් පිළිබඳ සීමාවන් :

අනු අංක (i) ඉවත් කරනු ලැබේ. අනෙකුත් කරුණු එලෙසම පවතී.

10.2.6 බඳවා ගැනීමේ ක්‍රමය :

(ii) ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

(iii) ඉහත උපඡේද (ii) හි සඳහන් අයදුම්කරුවන් අතරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව හා පුරප්පාඩු ප්‍රමාණයෙන් 25% ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත දැක්වෙන සංඛ්‍යාවට වඩා අඩු වුවහොත් එවැනි අවස්ථාවන්හි දී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාව පමණි.

මෙම ඡේදයේ උපඡේද (i) , (iv) , (v) සහ (vi) නොවෙනස්ව පවතී.

10.2.7 ලිඛිත විභාගය :

(අ) විවෘත ධාරාව යටතේ බඳවා ගැනීමට අදාළ ලිඛිත පරීක්ෂණය හා සම්බන්ධ කරුණු "ආ" පරිශිෂ්ටයේ දැක්වේ.

මෙහි (ආ), (ඇ) , (ඈ) සහ (ඉ) යන ඡේද නොවෙනස්ව පවතී.

10.2.9. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : යන ඡේදයට පහළින් ඇති II සංලක්ෂය ඉවත් කරනු ලැබේ.

13.1 සේවයේ තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන (II) ශ්‍රේණියට උසස් කිරීම :

13.1.1. (අ) (iv) උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

13.2 සේවයේ දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීම :

13.2. (අ) (iii) උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

13.3 සේවයේ පළමුවන (I) ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම :

13.3. (අ) (v) උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

දැනට පවතින "ආ" පරිශිෂ්ටය වෙනුවට මෙම පහත "ආ" පරිශිෂ්ටය ආදේශ කරනු ලැබේ.

**"ආ" පරිශිෂ්ටය**

**විවෘත ධාරාව යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තුන්වැනි (III) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන ලිඛිත තරග විභාගයෙහි විෂය නිර්දේශය**

රජයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා වන පොදු තරග විභාගය මේ සඳහා අදාළ වේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් වාර්ෂිකව පැවැත්වීමට කටයුතු කරනු ඇත. එම තරග විභාගයේ පළමු කොටසේ (පොදු කොටස) එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් 40% ක් හෝ ඊට වැඩි සහ ප්‍රශ්න පත්‍ර දෙකෙහි මුළු ලකුණු ප්‍රමාණය 100ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා අයදුම්කරුවන් පමණක් ඉහත විභාගයේ දෙවන කොටස සඳහා කැඳවනු ලැබේ.

(අ) රජයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන පොදු තරග විභාගයේ පළමු කොටස (පොදු කොටස)

(I) සාරාංශය

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 1 ½ | ලකුණු 100, සමත් ලකුණ 40යි.<br>බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| අවබෝධය | පැය 02 | ලකුණු 100, සමත් ලකුණ 40යි.<br>බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්න වලින් සමන්විත වේ. |

(II) විෂය නිර්දේශය

| බුද්ධි පරීක්ෂණය |
|---|
| අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලු විසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනාගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ. |
| අවබෝධය |
| අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කර ගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය හා නිර්මාණාත්මක බව ආදී කුසලතා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ. |

(ආ) රජයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන පොදු තරග විභාගයේ දෙවන කොටස (ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමට අදාල විශේෂිත කොටස)

(I) සාරාංශය

| ප්‍රශ්න පත්‍රය | කාලය | ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය |
|---|---|---|
| සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රවණතා | පැය 03 | ලකුණු 100, සමත් ලකුණ 40යි.<br>ව්‍යුහගත රචනා, බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| කළමනාකරණ අභියෝග්‍යතාව | පැය 03 | ලකුණු 100, සමත් ලකුණ 40යි.<br>ව්‍යුහගත රචනා, බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා | පැය 03 | ලකුණු 100, සමත් ලකුණ 40යි.<br>රචනා/ අර්ධ ව්‍යුහගත රචනා වලින් සමන්විත වේ. |

(II) විෂය නිර්දේශය

| |
|---|
| සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රවණතා |
| දේශීය හා විදේශීය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ තත්වයන් පිළිබඳ විෂයය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්වයන් හා අදාළව නිර්මාණාත්මකව, විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාවය තීරණය කිරීමේ කුසලතාවය හා ක්‍රමෝපායාත්මක අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාවය මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| කළමනාකරණ අභියෝග්‍යතාව |
| ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාවය, ස්වයං විනය ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම සහ භාවමය බුද්ධිය යනාදී වශයෙන් අපේක්ෂකයාට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්තාවන් අනුසාරයෙන් අපේක්ෂකයා සතු කුසලතාවය මැන බැලීම මෙයින් අදහස් කෙරේ. |
| නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා |
| දෙන ලද මාතෘකාවන් / තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකාවන් / තේමාවන් ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |

06 - 368

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.